# ලංසු සඳහා ආරාධනයයි!

## දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

# විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති විසින් දකුණු පළාතේ පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මහජන නියෝජිතයින්, බහුජන සංවිධාන, මගී ඉල්ලුම හා රටේ සංවර්ධන අවශ්‍යතා අනුව අධිකාරිය විසින් පරීක්ෂාකර, හඳුනාගත් මාර්ග සඳහා සාමාන්‍ය බස් සේවා /සාමාන්‍ය මාර්ගයේ සුඛෝපභෝගී බස් සේවා / දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුඛෝපභෝගී බස් සේවා වාර්ෂිකව බලපත්‍ර ගාස්තු අය කිරීමේ පදනම යටතේ මගී ප්‍රවාහන බලපත්‍ර 15 ක් නිකුත් කිරීමට, යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන්, මුද්‍ර තබන ලද ලංසු කැඳවනු ලැබේ. විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර සඳහා ලංසු පිරිනැමීමේ අයිතිය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය. ලංසු සඳහා ආරාධනා කරනු ලබන මාර්ග පහත පළ කරනු ලබන අතර, සෑම බස් සේවාවක් සඳහාම පහත ලේඛනයේ සඳහන් අනුමත ආසන ධාරිතාවයෙන් යුතු බස්රථ ඉදිරිපත් කළ යුතුය. ලංසුකරණය, ජාතික තරඟකාරී ලංසුකරණ කැඳවීම (NCB) යටතේ ලංසු ආරාධනා කැඳවනු ලැබේ.

- **වෙන් වෙන් වශයෙන් එක් ලංසුවකට රු.50,000/- බැගින් ආපසු ගෙවනු ලබන ඇප මුදලක් තැන්පත් කළ යුතුය.**
- **ලංසු සඳහා ආරාධනය කරනු ලබන සෑම මාර්ගයක් වෙනුවෙන්ම නියමිත කාලසටහන් හා ගාස්තු සටහන් සකස් කර ඇති අතර ලංසු ලේඛනය තුළ අයදුම්පත්‍ර සමග කාලසටහන් හා ගාස්තු සටහන් විස්තර ලබාදෙනු ලැබේ.**

ලංසු තැබීම මගින් ලබා දෙනු ලබන මාර්ගවල ගමනාන්ත අනෙකුත් බස් සේවාවන්ට වන බලපෑම හා නීතිමය කරුණු මත දීර්ඝ කිරීමක් හෝ වෙනත් මාර්ග සඳහා සංශෝධනය කිරීමක් සිදු කරනු නොලැබේ. මෙම මාර්ග වල මගී අවශ්‍යතාවය මත බස් සේවා තර කිරීමේදී ශ්‍රී ලංගම සමග (60%- 40%) පදනම මත අනාගතයේ බස් සේවා තර කිරීම සිදු කෙරේ. ඒ අනුව මාර්ග පරීක්ෂා කර බස් සේවා පවත්වා ගෙන යාමේ හැකියාව සලකා බලා පමණක් ලංසු වටිනාකම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි. මගී සේවා පිළිබඳ අවබෝධයකින් තොරව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉහළ මිල ගණන් ඉදිරිපත් කොට ඒ මත පසුව අභියාචනා කිරීමේ අයිතියක් ඉල්ලුම්කරුට නොපවතී.

ටෙන්ඩර් හිමිකම ලබා ගැනීමෙන් පසු දින 60 ක කාලය ඇතුළත බලපත්‍රය ලබාගෙන බස් සේවාව ආරම්භ කළයුතු අතර, එම කාලය දීර්ඝ කිරීමක් සිදු කරනු නොලැබේ. එහි වගකීම බලපත්‍රය ලබා ගත් තැනැත්තා විසින් දැරිය යුතුය.

ලංසු ආරාධනාවට අදාළ උපදෙස්, නියමයන් හා කොන්දේසි අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන බැවින් ඒ පිළිබඳ අවබෝධයකින් යුතුව ලංසුකරු ලංසු අයදුපත්‍ර ඉදිරිපත් කළ යුතුවේ.

ලංසු තැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන මාර්ග විස්තර

**ලංසු ආරාධනය - 01 (සාමාන්‍ය බස් සේවා බලපත්‍ර)**

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | වාර්ෂික අවම ලංසු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 2024/OPR/DEV/FI/01 | 336/2 | චමල් රාජපක්ෂ ආයුර්වේද රෝහල- රණවිරුගම්මානය - මයුරපුර - ගබඩාව හන්දිය - හම්බන්තොට | 30 | 272,100.00 |
| 2024/OPR/DEV/FI/02 | 344/12 | අම්බලන්තොට - දෙහිගහලන්ද කරිවිලයාය - අඩි 05 ඇල හන්දිය - කොඩිගල - මයුරපුර - උද්භිද උද්‍යානය - විත්‍රාගල - අම්බලන්තොට | 30 | 207,500.00 |
| 2024/OPR/DEV/FI/03 | 348/4 | යටියන - හිඟුරුපත්තල - ලෝලං ආර රත්මලේ - හුන්නදෙනිය - දික්වැල්ල | 35 | 337,050.00 |
| 2024/OPR/DEV/FI/04 | 371/1 | වැලිගම - වලාන රෝහල - මුදුගමුව - රණමයුරගම - තාකන්ද - කෝංගස්හේන - දිගරද්ද - අහංගම | 30 | 305,280.00 |
| 2024/OPR/DEV/FI/05 | 443 | යටියන - තිහගොඩ - වැල්ලෙකොට - මාලිම්බඩ - නාගොඩ හන්දිය - අකුරුගොඩ - සුල්තානගොඩ - ලැබීම | 35 | 322,500.00 |
| 2024/OPR/DEV/FI/06 | 585/4 | වලස්මුල්ල - මිදු ආර - උඩදෙණිය - කිවුල්මුල්ල | 30 | 164,700.00 |

**ලංසු ආරාධනය - 02 (සාමාන්‍ය මාර්ගයේ සුඛෝපභෝගී බලපත්‍ර)**

**ලංසු ආරාධනය - 02 (සාමාන්‍ය මාර්ගයේ සුබෝපභෝගී බලපත්‍ර)**

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | වාර්ෂික අවම ලංසු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 2024/OPR/DEV/FI/07 | 334/1/AC | මාතර - දික්වැල්ල - මහවෙල - තංගල්ල - හම්බන්තොට. | 35 | 1,008,000.00 |
| 2024/OPR/DEV/FI/08 | 382/AC | අකුරැස්ස - යක්කලමුල්ල - මාකුඹුර - කරාපිටිය - ගාල්ල | 35 | 932,400.00 |
| 2024/OPR/DEV/FI/09 | 388/AC | බලපිටිය, අම්බලන්ගොඩ - හික්කඩුව - ගාල්ල - මාතර, රුහුණු විශ්වවිද්‍යාලය. | 35 | 1,008,000.00 |
| 2024/OPR/DEV/FI/10 | 404/2/AC | පිටිගල - මාපලගම - වදුරඹ - කරාපිටිය - ගාල්ල. | 35 | 1,058,400.00 |

**ලංසු ආරාධනය- 03 (දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුබෝපභෝගී බලපත්‍ර)**

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | වාර්ෂික අවම ලංසු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 2024/OPR/DEV/FI/11 | 17/EX/AC | සූරියවැව - පදලංගල - අඟුණකොලපැල්ස්ස - කරාපිටිය - ගාල්ල (අඟුණකොලපැලැස්ස - පින්නදූව අධිවේගී මාර්ගය හරහා) | 35 | 841,050.00 |
| 2024/OPR/DEV/FI/12 | 32/5//EX/AC | මිද්දෙණිය - වීරකැටිය - තංගල්ල - බෙලිඅත්ත - කරාපිටිය - ගාල්ල (කහවත්ත - පින්නදූව අධිවේගී මාර්ගය හරහා) | 35 | 746,550.00 |
| 2024/OPR/DEV/FI/13 | 386/4//EX/AC | ඌරගස්මන්හන්දිය - ඇල්පිටිය - කරාපිටිය - ගාල්ල (කුරුඳුගහහැතැක්ම - පින්නදූව අධිවේගී මාර්ගය හරහා) | 35 | 1,360,800.00 |
| 2024/OPR/DEV/FI/14 | 386/5/EX/AC | ඇල්පිටිය - බටපොල - අම්පේගම - බද්දේගම - මාතර දික්වැල්ල මහවෙල - තංගල්ල (බද්දේගම ගොඩගම අධිවේගී මාර්ගය හරහා) | 35 | 1,530,000.00 |
| 2024/OPR/DEV/FI/15 | 390/EX/AC | අම්බලන්ගොඩ - මහද්දණ්ඩ- කරාපිටිය - ගාල්ල (කුරුඳුගහහැතැක්ම - පින්නදූව අධිවේගී මාර්ගය හරහා) | 35 | 1,247,400.00 |

1. අභිලාෂී ලංසුකරුවන්ට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත දක්වා ඇති එක් එක් ලංසු ආරාධනයන්හි වෙන් වෙන් වශයෙන් සඳහන් ලංසු සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් දෙදහසක (රු.2,000/- ක) අයදුම්පත්‍ර ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2024/04/01 වන දින සිට 2024/04/24 දින දක්වා කාර්යාල දිනයන් තුළ පෙ.ව. 8.30 සිට ප.ව 3.00 දක්වා ධාවන අංශයෙන් මිලදී ගත හැකිය.
2. අභිලාෂී යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු හා ලංසු ලිපි ලේඛන කාර්යාල වේලාව තුළ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කිරීම සිදු කල හැකිය.
3. ලංසු ඉදිරිපත් කළයුතු අවසාන දිනය 2024 අප්‍රේල් මස 25 වන දින 1130 පැය වන අතර එදින 1200 ට අධිකාරියේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරයේදී කොටස් වශයෙන් ලංසු විවෘත කරනු ලැබේ.
4. නිසි පරිදි සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් **"අනු පිටපතකින්"** යුක්තව ලියාපදිංචි තැපෑලෙන් ගාල්ල, කොටුව, ලේන්බාන් විදිය, නො.67හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ යොමු කිරීම හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම ලංසු ලබා ගන්නා අවසන් වේලාවට හෝ ඊට පෙර සිදු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඊට අදාළ යොමු අංකය සමග යොමු කරන සේවාව සාමාන්‍ය බස් සේවා බලපත්‍රයක් නම් **"සාමාන්‍ය බස් සේවා බලපත්‍ර - 2024"** ලෙසද, යොමු කරන සේවාව සාමාන්‍ය සේවාවේ සුබෝපභෝගී බලපත්‍රයක් නම් **"සාමාන්‍ය මාර්ගයේ සුබෝපභෝගී බලපත්‍ර - 2024"** ලෙසද, යොමු කරන සේවාව දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුබෝපභෝගී බලපත්‍රයක් නම් **"දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුබෝපභෝගී බලපත්‍ර - 2024"** ලෙසද සඳහන් කළ යුතුය.
5. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු බව දැනුම් දෙනු ලැබේ. මෙම නියෝගය කඩ කරනු ලබන අයදුම්කරුවන්ගේ ලංසු අයදුම්පත විවෘත කරනු නොලැබේ. ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මූලික තොරතුරු දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සියළුම දිස්ත්‍රික් කාර්යාලවලින් හෝ අංක . 67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල ලිපිනයෙන් හෝ www.sprpta.lk වෙබ් අඩවියෙන් හා දුරකථන අංක 091- 2234237/091-2227074 මගින් විමසිය හැකිය.

**අරුණ ගුණරත්න**
**සභාපති, ද. ප. මා. ම. ප්‍රවාහන අධිකාරිය,**
**ගාල්ල.**
**2024.03.27**